# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1954/14 - 2016 පෙබරවාරි මස 17 වැනි බදාදා - 2016.02.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : RPDS/LND/09/ACQ/01/08.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර :*

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුරුවිට කෝරළේ උඩ පත්තුව සුළු කොට්ඨාශයේ, 152බී වෙරළුප ග්‍රාමනිලධාරි කොට්ඨාශයේ, රත්නපුර නගරය (රත්නපුර මහ නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් සම්පාදිත අංක ර. 299 මුලික පිඹුරේ කැබලි අංක 01 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.0118 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබැල්ල වේ.

1. **කැබලි අංක 01**

ඉඩමේ නම: ඕවිලනවත්ත; විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා: ඩික්සන් දැල බණ්ඩාර, නිලංග දැල බණ්ඩාර, සුජීව විජේවර්ධන සහ සුදත් විජේවර්ධන, අංක 278, කොළඹ පාර, රත්නපුර; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0118.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියකියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2016 පෙබරවාරි මස 26 වැනි දින ප. ව. 2.00 ට රත්නපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2016 පෙබරවාරි මස 19 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම්/පරවශතාව ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

සී. එම්. කෝට්ටවත්ත,
ප්‍රාදේශීය ලේකම්,
රත්නපුර.

2016 ජනවාරි මස 26 වැනි දින,
රත්නපුර ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

03 - 63

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G 23032 - 16 - (2016/02)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.